www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ජාත්‍යන්තරවාදය හා සමාජවාදය සඳහා අරගලය

## Internationalism and the struggle for socialism

**නික් බීම්ස් විසිනි**

**2009 මැයි 20**

පහත පලවන්නේ "ලෝක ආර්ථික අර්බුදය, ධනවාදයේ අසමත්කම හා සමාජවාදය සඳහා ඉඩ ප්‍රස්ථා" යන මාතෘකාව යටතේ ලෝක සමාජවාදී වෙබ් අඩවිය හා සමාජ සමානතාවය සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ විසින් පවත්වන්නට යෙදුන ප්‍රාදේශීය සමුලු වලට ඔස්ට්‍රේලියානු සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික ලේකම් නික් බීම්ස් විසින් ඉදිරිපත් කල වාර්තාවේ සටහන් ය.

හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව හා ඕස්ට්‍රේලියානු සමාජවාදී සමානතා පක්ෂයේ සියලු සාමාජිකයන් වෙනුවෙන් මෙම සමුලුවට උනුසුම් විප්ලවවාදී සුබපැතුම් ගෙන ඒමට මම කැමැත්තෙමි.

ලෝක ධනවාදයේ හරි මැද, තිරිසනාගේ උදරයෙහි යයි ද කිව හැකි, එක්සත් ජනපදය පුරා නගර තුනක දී සසප පවත්වන මෙම සමුලු, ලෝක ධනවාදයේ මෙම ඓතිහාසික අර්බුදය වටහා ගැනීමත්, කම්කරු පන්තිය සඳහා සමාජවාදී ඉදිරිදර්ශනයක් වර්ධනය කිරීමත් සම්බන්ධයෙන් ගත් කල, කම්කරු පන්තියට හා ලෝකය පුරා පීඩිත ජනතාවන්ට ඉමහත් වැදගත් කමක් දරා සිටියි.

අප ලෝක පක්ෂයක සාමාජිකයන් ලෙස වැඩකිරීමේ කාරනයෙහි වැදගත්කම අවධාරනය කරමින් පටන් ගැනීමට මට ඉඩ දෙන්න. ජාත්‍යන්තර ප්‍රවනතාවක් ලෙස සියලු අංශවලින් එහි වැඩ කටයුතු ජාත්‍යන්තර පදනමක ක්‍රියාත්මක කරන එකම පක්ෂය හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව පමනි. සියලු රටවල කම්කරුවන් එකට ඈඳ බැඳ ගැනීමට අපේක්ෂා කරන එකම පක්ෂය ද මෙයයි. ට්‍රොට්ස්කිගේ වැකියක් යොදා ගත්තේ නම් "එකම ජාත්‍යන්තර නිර්ධන පන්තික සංවිධානයකට පමනක් විප්ලවවාදී ක්‍රියාවේ දී එක ලෝක මධ්‍යස්ථානයක් හා එක් දේශපාලන දිශානතියක් ඇත්තේය."

හරියටම මේ නිසා, ලෝක ධනවාදයේ බිඳ වැටීමට මුහුන දීම සඳහා, පන්ති අරගලයේ වර්ධනය මත පදනම්ව, සමාජවාදී ඉදිරිදර්ශනයක් වර්ධනය කිරීමට කැපවීගත් එකම පක්ෂය හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව පමනකි.

ජාත්‍යන්තර සමාජවාදී ක්‍රියා මාර්ගයක් වර්ධනය කිරීම සඳහා ට්‍රොට්ස්කි විසින් ගෙන ගිය අරගලයේත්, සෑම රටකම කම්කරු පන්තියේ අරගලය සඳහා එකම ශක්‍ය පදනම ලෙස ජාත්‍යන්තරවාදී ඉදිරිදර්ශනයක් සඳහා දශක හයකට ආසන්න කාලයක් හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව විසින් ගෙනගිය අරගලයේත්, ඓතිහාසික වැදගත්කම සලකුනු කිරීම සඳහා මෙය ප්‍රතිපදානයකි.

ප්‍රධාන ධනේශ්වර රටවල කම්කරු පන්ති ව්‍යාපාරය මත ආධිපත්‍ය දරන ලද ජාතිකව පදනම් වූ දැවැන්ත නිලධාරිවාදී සංවිධාන, පක්ෂ හා වෘත්තීය සමිති වලට සිදුව ඇත්තේ කුමක් ද? මෙම අර්බුදයට මුහුන දිය හැකි ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග ඔවුන් සතුව නොමැතිවා පමනක් නොව, එය කම්කරු පන්තියේ කර මත පැටවීම සඳහා ඔවුහු සෑම රටකම පාලක පැලැන්තීන් හා ආන්ඩු සමග සමීපව වැඩ කරති.

ජෙනරල් මෝටර්ස් හා ක්‍රයිස්ලර් සමාගම්වල අයිතිකාර ව්‍යුහය තුලට දැන් ඒකාග්‍රවී ඇති එක්සත් මෝටර් රථ කම්කරු සමිතියේ (යූඒඩබ්ලිව්) පරිනාමය, ජාත්‍යන්තර ක්‍රියාවලියක අතිශය දැවෙන ප්‍රකාශනය වනවා පමනි. ජාතිකව පදනම් වූ වෘත්තීය සමිති හා කම්කරු සංවිධාන ක්‍රියා කරන්නේ ප්‍රාග්ධනයේ පොලිස්කාරයෙකු ලෙසය. ඔවුන් කම්කරු පන්තියේ ආසක්තයන් සමග පැවති කුමන හෝ බැඳීමකින් තෙමේම කැඩී වෙන්වී ගොසින්ය.

ජාත්‍යන්තරවාදයේ අවශ්‍යතාවය මත අපගේ ව්‍යාපාරය යොදන අවධාරනය, ආත්මීය ගනන් බැලීම් තුලින් මතුවන්නක් නොවේ. ඊට වෙනස් ලෙසින් එය, ලෝක ධනේශ්වර ක්‍රමය තුලම පවත්නා ප්‍රගාඪ වෛෂයික ප්‍රවනතාවන්ගේ පිලිබිඹුවකි. මෙම අර්බුදය, ධනවාදයේ මෙම බිඳ වැටීම, පිලිබඳ කුමන හෝ විද්‍යාත්මක සමාලෝචනයක්, කම්කරු පන්තිය හා සමස්තයක් ලෙස මහජනතාවන්ම, ඔවුන් සිටින්නේ

ඇමරිකාවේ, බ්‍රිතාන්‍යයේ ඕස්ට්‍රේලියාවේ හෝ චීනයේ, ඉන්දියාවේ හෝ වෙන යම් තැනක වේවා, දැන් මුහුන දෙන විවිධාකාර ගැටලු සඳහා ජාතික විසඳුම් නැත යන නිගමනය කරා පැමිනෙනු ඇත. එවන් විසඳුමක්, අර්බුදය ම දිගහැරී ඇති ආකාරයෙන් සලකුනු කෙරෙන අංග ලක්ෂනයක් වන ලෝක ආර්ථිකයේ සමස්ත ඒකාග්‍රකරනයේ ස්වභාවය මගින් ම බැහැර කෙරෙයි.

2007 වසරේ දී එක්සත් ජනපදයේ දැන උගත් හෝ සමහර විට එසේ නොවූ, ධනේශ්වර අර්ථශාස්ත්‍රඥයන් හා මාධ්‍ය පන්ඩිතයන් කියා සිටියේ, ඊනියා අවමුඛ අර්බුදය ඉක්මනින්ම පහව යන සීමිත මූල්‍ය අවහිරතාවක් බවය. ඔවුන් සේ ම ඔවුන්ගේ දූර දැක්මක් නැති ජාත්‍යන්තර සහකරුවන් ද දරා සිටියේ, අර්බුදය හුදෙක් එක්සත් ජනපදයේ ගැටලුවක් බව හා තමන්ගේ වඩා හොඳින් පරිපාලනය කල මූල්‍ය පද්ධතීන් කෙරෙහි එහි බලපෑමක් නොමැතිය යන ආස්ථානයයි. ඇමරිකානු ආර්ථිකයට කුමන ගැටලු වලට මුහුනපෑමට සිදු වුවත්, අවශේෂ ලෝකයට වැඩිමනත් ලෙස බෙහෙවින් බැටකෑමට සිදු නොවනු ඇත. මක්නිසාද යත් එයට එක්සත් ජනපදයෙන් "ගැලවී වෙන්වීමට" හැකි නිසාය.

එවන් මිත්‍යාවන් සැබවින්ම හා තරයේ ම හෙල්ලුම් කා තිබේ. මෑතක දී, සුප්‍රකට අර්ථශාස්ත්‍රඥයන් වන බැරී අයිකන් ග්‍රීන් හා කෙවින් ඕ රූකි, ගෝලීය පරිහානියේ පරිමාව පිලිබඳව බෙහෙවින් හෙලිදරව් කාරී ප්‍රස්ථාර සමහරක් ප්‍රසිද්ධියට පත්කලහ. කාර්මික නිෂ්පාදනයේ, වෙලඳමේ හා කොටස් වෙලඳපොල වටිනාකම්හි වැටීම, ගෝලීය පරිමානයකින් ගත් කල, 1929 මහා බිඳ වැටීමෙන් පසුව එලඹි කාල පරිච්ඡේදයේදීට වඩා වේගවත් අනුපාතයකින් සිදුවෙමින් ඇති බව ඔවුහු පෙන්වා දුන්හ.

එසේනම් මෙම අර්බුදය පිලිබඳව ධනේශ්වර අර්ථශාස්ත්‍රඥයින් හා කථිකයන් විසින් ඉදිරිපත් කරන්නේ කවර විශ්ලේෂනයක් ද? මෙම කන්ඩායමේ වඩා සංවේදී මාටින් වුල්ෆ් යන *ෆිනෑන්ෂල් ටයිම්ස්* පුවත්පතේ ආර්ථික විශ්ලේෂකයා අපි විමසා බලමු. රේගන් හා තැචර් බලයට පත්වීමේ දී ඒ සමඟ බැඳී පැවතුනු "නිදහස් වෙලඳපොල" යන නව ලිබරල් දෘෂ්ටිවාදයේ සම්පූර්න ආකෘතිය ම බිඳ වැටී තිබෙන ආකාරය කෙරෙහි ඔහු අවධානය යොමු කරයි.

මාර්තු 9 වන දින "එයම විනාශයට පත් කල බීජ" යන හිසින් යුක්තව පල කල තීරුවක් ඔහු ආරම්භ කරන්නේ මෙලෙසින්ය. "තවත් දෘෂ්ටිමය දෙවියෙක් ඇද වැටී තිබේ. දශක තුනක කාලයක් තිස්සේ ප්‍රතිපත්ති පාලනය කල අභ්‍යුපගමයන්, විප්ලවවාදී සමාජවාදය පරිද්දෙන්ම හදිසියේ යල්පැන ඇති බව පෙනී ගියේය."

වෙනත් වචන වලින් කිවහොත් අර්බුදය අසාර්ථක දෘෂ්ටිවාදයක ප්‍රතිපලය මිස ධනේශ්වර පද්ධතිය තුලම ගැබ්ව පවතින වෛෂයික ප්‍රතිවිරෝධයන් ක්‍රියාවට බැසීමේ ප්‍රතිපලය නොවේ. දැන් නිවැරදි පිලිවෙත් හඳුන්වා දුන හොත් හා අතීත වැරදි නිවැරදි කර ගන්නේ නම්, ධනවාදයට යලි ප්‍රගතිය කරා පිවිසිය හැකිය.

එහෙත් තමන් සිටින්නේ වෙවුලුම්කන බිමක බව හැඟී ගිය නිසාදෝ වුල්ෆ්, විප්ලවවාදී සමාජවාදය ද ඊට ඈඳගනියි. විප්ලවවාදී සමාජවාදය පෙර කවර කලෙකටත් වඩා ශක්‍ය බව පෙනී යන බැවින්, මෙය වනාහි සුසාන භූමියක් අසලින් ගමන් ගන්නා විට උරුවම් බාන්නා වැනි දෙයකි.

ධනවාදයේ ආරක්ෂකයන් සියල්ලන්ම මෙන් වුල්ෆ් ද තම ප්‍රකාශය පිහිටුවන්නේ, 1989-91 අතර කාලයේ බිඳ වැටුනු සෝවියට් සංගමයේ හා නැගෙනහිර යුරෝපයේ ස්ටැලින්වාදී තන්ත්‍රයන් සමග විප්ලවවාදී සමාජවාදය අනන්‍ය කිරීම මතය. මෙහිදී එවක විප්ලවවාදී සමාජවාදීන් පලකල අදහස් සිහියට නගා ගැනීම උපදේශාත්මකය. එවන් උපහරන අතුරෙන් එකක් පමනක් මම මෙහිදී ගෙන හැර දක්වන්නෙමි.

එක්සත් ජනපදයේ සමාජවාදී සමානතා පක්ෂයෙහි පූර්වගාමියා වූ වර්කර්ස් ලීගය, බර්ලින් තාප්පය බිඳ වැටීමෙන් යන්තම් තෙමසකට පසුව, 1990 පෙබරවාරියේ දී සම්මත කල ඉදිරිදර්ශන යෝජනාව තුල මෙසේ සඳහන් කලේය. "නැගෙනහිර යුරෝපීය තන්ත්‍රයන් බිඳී විසිරී යාම සමස්තයක් ලෙස ලෝක ආර්ථිකයේ වර්ධනයන්ගෙන් ස්වාධීනව පැහැදිලි කල නොහැකිය. නැගෙනහිර යුරෝපයේ සමාජ කැලඹීම්, ස්ටැලින්වාදයේ අර්බුදය හෙලිදරව් කරනවා පමනක් නොව, ඒවා ම ලෝක අධිරාජ්‍යවාදයේ පොදු අර්බුදයෙහි වැඩි දියුනු දේශපාලන ප්‍රකාශනයන් වන්නේය."

එවක දී ධනේශ්වර ශාස්ත්‍රාලිකයන් හා විචාරකයන් "ඉතිහාසයේ අවසානය" හා ධනවාදයේ ද නිදහස් වෙලඳපොලේ ද අවසන් ජයග්‍රහනය පිලිබඳව වපුරන ලද මති මතාන්තර වලට කෙලින්ම විරුද්ධව වර්කර්ස් ලීගය විසින් වර්ධනය කල ඉදිරිදර්ශනය, මුලුමනින්ම සනාථ වී තිබේ. වුල්ෆ් නිදහස් වෙලඳපොල දෘෂ්ටිවාදයේ අසාර්ථකත්වය ගැන කථා කරන ආකාරය දෙස බලන විට පෙනී යන්නේ දැන්, ප්‍රාග්ධනයේ මෙම ක්ෂමාලාපකයන්ට යම් ආකාරයකින් තම ආස්ථානයන් වෙනස් කිරීමට බලකෙරී ඇති බවයි. එහෙත් මෙම අර්බුදය පිලිබඳව විශ්ලේෂනයක් ඉදිරිපත් කිරීමේ අහලකටවත් මොවුන් පැමින ඇත්තේ නැත. ඒ මීට විසි වසරකට පෙර, ස්ටැලින්වාදී තන්ත්‍රයන්ගේ අභාවයේ සැබෑ වැදගත්කම අවබෝධ කර ගැනීමට අසමත් වූ පරිද්දෙන්ම ය.

ඔවුන්ට ප්‍රයෝජනවත් කරුණු හා සංඛ්‍යාලේඛන ගෙන හැර දැක්වීමට මෙන් ම වැදගත් ක්‍රියාවලීන් පෙන්වා දීමට පවා හැකි වුව ද, ධනේශ්වර අර්ථශාස්ත්‍රඥයන් හා කථිකයන් කිසිවෙකුටත්, අර්බුදය පිලිබඳව විද්‍යාත්මක සමාලෝචනයක් ගෙන ඒමට හැකිවී නැත.

ඒ ඔවුන්ගේ දෘෂ්ටිවාදාත්මක දැක්ම හා පන්ති ආස්ථානය ධනේශ්වර පද්ධතියේ සදාකාලිකත්වය මත පිහිටා තිබීම නිසාය. එබැවින් ඔවුන්ට අනුව, අර්බුදයේ මූලාශ්‍ර සොයාගත යුත්තේ ධනේශ්වර ආර්ථිකයේ මූලික නියාම හා පරස්පරවිරෝධයන් තුල නොව ඉන් පරිබාහිරව ය. සිදුවෙමින් ඇත්තේ ධනේශ්වර නිෂ්පාදන විධියේ ම බිඳ වැටීම නොව, දෘෂ්ටිමය ආකෘතියක බිඳ වැටීම, ආර්ථිකය හැසිරවීම බාරව සිටි අයගේ ප්‍රමාද දෝෂයක් හා අනවබෝධයක් මත ඇතිව තිබෙන ධනවාදයේ "අච්චුවක", අසාර්ථකත්වයයි.

මාර්තු 10 වන දින *ෆිනෑන්ෂල් ටයිම්ස්* හි "සදොස් ආර්ථික විද්‍යාවේ ප්‍රතිවිපාක" යන හිසින් යුත් කතුවැකියකින්, එය පාත් කර ඇත්තේ දේශපාලන නායකයන්ගේ හා නියාමකයන්ගේ බුද්ධි හීනතාවය මතට ය.

කතුවැකිය මෙසේ සටහන් කරයි. "වෙලඳපොල ධනවාදයේ මලගම සනිටුහන් කරමින් සීනුව හැඬවූ අයට එබැවින් වැරදී ඇත. මෙය වෙලඳපොලේ අසාර්ථකත්වය නොව උචිත වෙලඳපොලවල් නිර්මානය නොකිරීමේ ආනිසංශයයි. දොස් පැවරිය යුත්තේ ග්‍රීන්ස්පෑන් මහතාගේ නොතැකීමෙන් මූර්තිමත් කල නිශ්චිත මනෝභාවයකට ය. එය ධනේශ්වර ආර්ථිකයේ නෛසර්ගික අස්ථායීකරනයන් නොතකා හැරීම මගින්, එම අස්ථායීකරනයන් කලමනාකරනය කිරීමේ හැකියාවෙන් යුතු හා එසේ කිරීම ඔවුන්ගේ වගකීම වූ ප්‍රතිපත්ති සම්පාදකයන්, කොක්කෙන් මුදා හැරියේය. මෙය සමාජ පද්ධතියක බංකොලොත් කම නොව එහි භාරකාරත්වය දැරූ අයගේ බුද්ධිමය හා සදාචාරාත්මක අසාර්ථකත්වයයි. මෙය වනාහි කිසිදු සමාවක් නැති නොහැකියාවකි."

සිය සිසුන් යමක් ගැන ගැඹුරින් සොයා බැලීමට දරන උත්සාහය වැලැක්වීම සඳහා පිටි අල්ලට පහරක් දෙන ඇට්ටර ඉංග්‍රීසි ගුරුවරයෙකුගේ රටාව එම පුවත්පත විසින් ද අර්බුදය පතුලේ ඇති හේතු සොයා ගැනීම වැලැක්වීම සඳහා අනුගමනය කරමින්, අලුත් මනෝභාවයක් පිහිටුවා ගැනීමෙන් පර්යාය පුනරුත්ථාපනය කල හැකි බවට සහතික වෙයි.

ජී 20 රැස්වීම අභියස අප්‍රේල් 8 වන දින පලකල ප්‍රකාශයකින් මාටින් වුල්ෆ්, සමහර විට "නිරර්ථකවූ දෘෂ්ටිවාදය" යන්න සෑහෙන පැහැදිලි කිරීමක් නොවේ යයි හඟිමින් දෝ, ප්‍රධාන කොට ම එක්සත් ජනපද ගෙවුම් ශේෂ හිඟය හා එරට සමඟ ඇති චීනයේ වෙලඳ අතිරික්තය මගින් නිර්මානය කර තිබෙන ලෝක ආර්ථිකයේ දැවැන්ත අසමතුලිතය, අර්බුදයට හේතුව ලෙස ගෙනහැර දක්වයි.

"අර්බුදයට හේතුව තනිකර ම එක්සත් ජනපදයේ, එක්සත් රාජධානියේ හා තවත් රටවල් ස්වල්පයක මූල්‍ය පද්ධතීන්ගේ ප්‍රති නියාමනය හා වැරදි නියාමනය බව විශ්වාසයට ගැනීම බොහෝ දෙනෙකුට පහසු මගක් වනු ඇත. එහෙත් ලෝකයේ සාර්ව ආර්ථික අසමතුලිතයේ පරිමාව සැලකිල්ලට ගන්නා කල, ඉහල නියාමන ප්‍රමිතීන් පමනක් ලෝකය ගලවා ගැනීමට සමත් වන්නේ යයි සිතීම අධි තක්සේරුවකි."

එහෙත් මෙය ගැටලුව තවත් අඩියක් පස්සට තල්ලු කිරීමක් පමනි. මක්නිසා ද යත් පලමු කොට ම මෙම අසමතුලිතයන් කවර හේතු නිසා ඇති වූයේ ද යන ප්‍රශ්නය වහා ම මතුවන බැවිනි. ඒවා මතුවූයේ කවර ක්‍රියාවලීන් තුලින් ද? ඒවා එක්සත් ජනපද හා ලෝක මූල්‍ය පද්ධතිය මත මේසා විනාශකාරී බලපෑමක් ඇති කලේ කුමක් නිසා ද?

සැබවින්ම දැවැන්ත පරිමාවකින් නයෙහි වැඩී යාම අර්බුදයට හේතුව බව බොහෝ ප්‍රකාශකයන්ගේ තර්කයයි. එහෙත් මෙහි දී ද එය සිදුවූයේ කුමක් නිසා ද? යන ප්‍රශ්නය යලිත් මතුවෙයි.

අර්බුදය පසුබෑමක, ඉතා බරපතල පසුබෑමක, රූපය ගනු ඇතැයි බොහෝ දෙනෙකු අපේක්ෂා කරන නමුදු එය පසුබෑමක් පමනකි. කෙසේ වෙතත් එම මිත්‍යාව යමෙක් සමහර මූලික ප්‍රශ්න සැලකිල්ලට ගන්නා කල සුනු විසුනුවී යයි. ධනේශ්වර ආර්ථිකය පසුබෑමට ඇතුලු වන විට තිබුනු, ලාභදායක බවින් අඩු ක්ෂේත්‍රයන් දැන් අතුගෑවී ගොස් තිබීම හැරුනු කල, සාමාන්‍ය පසුබෑමකින් එය යලි හිස ඔසවනු ඇත. එහෙත් මෙම අර්බුදයේ ප්‍රතිපලය යලි තිබූ තත්ත්වයට පැමිනීම විය නොහැකිය. අති සංකීර්න මූල්‍ය උප්පරවැට්ටි මත පදනම්ව තිබූ ලාභ සමුච්ඡයකරනයේ සමස්ත පද්ධතිය ම බිඳවැටී තිබේ. මෙය හුදු පසුබෑමක් නොව බිඳ වැටීමකි.

අර්බුදය පැහැදිලි කිරීමට ධනේශ්වරය හා ඔවුන්ගේ සියලු නියෝජිතයන් විසින් දරන ලද උත්සාහයේ දී කැපී පෙනුන එක් ලක්ෂනයක් වන්නේ, ඔවුන්ගේ ඓතිහාසික විරෝධී ස්වභාවයයි. ඔවුන් වත්මන් වර්ධනයන්, ධනවාදයේ ඓතිහාසික පරිනාමයේ සන්දර්භයෙහි පිහිටුවීමට කිසිදු උත්සාහයක් දරා නැත. එයට හොඳ හේතුවක් තිබේ. එසේ කලේ නම් බිඳවැටීම ආරම්භ වන්නේ බාහිර සාධක වලින් නොව ධනවාදී ආර්ථිකය ඇතුලාන්තයේ ම

ක්‍රියාකාරිත්වය මගින් බව පැහැදිලි වීමට පටන් ගැනීම එම හේතුවයි.

එබැවින් අර්බුදය හටගැනීමට තුඩු දුන් ධනේශ්වර නිෂ්පාදන මාදිලීන්ගේ ප්‍රතිවිරෝධයන්හි ඓතිහාසික සංවර්ධනය අප විසින් විමර්ශනය කල යුතුය. මෙම ප්‍රතිවිරෝධයන් මූලික රූපයන් දෙකකින් ප්‍රාදුර්භූත වෙයි. දැන් නිෂ්පාදනයේ භූගෝලීයකරනය හා ආර්ථික ක්‍රියාවලියේ පෙර නොවූ විරූ පරිමානයක ජාත්‍යන්තර ඒකාග්‍රකරනය තුල ප්‍රකාශනය අත්කර ගන්නා ලෝක ආර්ථිකයේ වර්ධනය ද, ලෝකය ප්‍රතිමල්ලව හා ගැටුම්කාරී ජාතික රාජ්‍යයන් වශයෙන් බෙදී යාම ද අතර ප්‍රතිවිරෝධය පලමු වැන්නයි. විද්‍යාවේ හා තාක්ෂනයේ ඉමහත් වර්ධනය මගින් ජනනය කල විභවය තුල, ශ්‍රම පලදායීතාවයේ ඉහල යාමත්, නිෂ්පාදන මාධ්‍යයන්ගේ පෞද්ගලික අයිතියේ පද්ධතියත් අතර පවතින ප්‍රතිවිරෝධය දෙවැන්නයි. මෙම පරස්පර විරෝධය ලාභානුපාතිකය වැටීමේ ප්‍රවනතාවය තුල ප්‍රකාශයට පත්වෙයි.

වත්මන් අර්බුදය පිලිබඳ සාකච්ඡාවන් තුල, එය මහා අවපාතය සමග සැසඳීම හා ඒ ගැන කරන සඳහන් කිරීම් ඔබට නිරතුරුව මුනගැසෙනු ඇත. කෙසේ වෙතත් තවත් පසු පසට යෑම අවශ්‍ය වෙයි. මහා අවපාතයමත්, 1914 ප්‍රථම ලෝක සංග්‍රාමය පුපුරා යාමත් සමඟ හටගත් ධනේශ්වර නිෂ්පාදන මාදිලියේ පලමු බිඳ වැටීමේ නිමැවුමක් විය.

වත්මන් කඩාවැටීමට මෙන්ම පලමුවැන්නට ද පූර්වයෙන් පැවතුනේ ධනේශ්වර ශුභවාදයේ කාල පරිච්ඡේදයකි. 20 වන සියවස ආරම්භ වන විට පෙනී ගියේ, අවම වශයෙන් වඩා ගැඹුරට හාරා ඇවිස්සිය යුතු නොවේ යයි සලකා ගත් අයට, ධනවාදය එහි උපතේ පටන් ම හා එහි සංවර්ධනයේ මුල් අදියරයන්හි එය කැටිකර ගෙන තිබූ ගැටලු විසඳී ඇති සෙයකි. ධනේශ්වරයේ ආරක්ෂාව යටතේ මානව වර්ගයාගේ ප්‍රගමනයෙහි නව අවධියක් ඇරඹී ඇතුවා සේය. මෙම ක්‍රියාවලිය මගින් ජනනය කල දෘෂ්ටිමය බලපෑම එහි පිලිබිඹුව සොයා ගත්තේ සමාජවාදී ව්‍යාපාරය තුලය. ජර්මානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය ඇතුලත බර්න්ස්ටයින් කියා සිටියේ, මාක්ස්ගේ බිඳ වැටීමේ න්‍යාය නිෂ්ප්‍රභාවී ඇති බවත්, විප්ලවය ශක්‍ය නොවන හා අනවශ්‍ය බවට පවා පත්ව ඇති බවත්ය. මක්නිසා ද යත් සමාජවාදය ධනවාදයේ ම අඛන්ඩ ප්‍රතිසංස්කරනය තුලින් සාක්ෂාත් කර ගත හැකි නිසාය.

1914 ධනවාදයේ බිඳ වැටීම, යුද්ධය ලෙසින් තෙමේම නිවේදනය කලේ, මෙතැන් පටන් යුද්ධයක්, පෙර නොවූ විරූ ප්‍රචන්ඩත්වය හා ව්‍යසනය තුලින් සැබවින්ම ම්ලේච්ඡත්වය තුලට ම කඩා වැටෙනු ඇති බවයි. ප්‍රථම ලෝක සංග්‍රාමය තහවුරු කලේ, සමාජවාදය ආර්ථික හා සමාජ සංවර්ධනයේ හුදෙක් වඩා වාසිදායක ක්‍රමය වනවා පමනක් නොව, ඓතිහාසික අවශ්‍යතාවක් ද වන බවයි. 1917 රුසියානු විප්ලවයේ දී කම්කරු පන්තිය මෙම අරමුන ඉෂ්ට කිරීමේ ප්‍රථම පියවර තබනු ලැබීය. එහෙත් කම්කරු පන්තියේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී නායකත්වයෙහි පාවාදීම් නිසා විප්ලවය හුදෙකලාවී පැවතුනි. මෙම හුදෙකලාව ස්ටැලින්ගේ නායකත්වයෙන් යුත් ජාතිකවාදී නිලධාරි තන්ත්‍රයක් මතුව ඒමට කොන්දේසි නිර්මානය කල අතර එම තන්ත්‍රය, විප්ලවය පදනම් කොටගත් මාක්ස්වාදී සංස්කෘතිය කායිකව ම විනාශ කර දමමින්, ධනේශ්වර ලෝක පර්යායේ ප්‍රධාන මුක්කුව බවට පත්විය.

මහා විරැකියාව, ෆැසිස්ට්වාදයේ භීෂනය හා කෝටි සංඛ්‍යාත ජීවිත විනාශ කල ලෝක යුද්ධ දෙකකින් පසුව, අවසානයේ දී එක්සත් ජනපද ධනවාදයට, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී හා ස්ටැලින්වාදී පක්ෂවල සහයෝගය ඇතිව ලෝක ධනවාදය යලි ස්ථාවරත්වයකට ගෙන ඒමට හැකි විය. 1944 බ්‍රෙට්න්වුඩ්ස් සමුලුවේ දී හා 1947 මාර්ෂල් සැලැස්මෙන් පිහිටුවන ලද නව මූල්‍ය පද්ධතිය තුලින්, 1940 ගනන් අවසානයෙන් පසුව ආර්ථික ප්‍රසාරනයේ නව යුගයක් වර්ධනය කරන ලදී.

එහෙත් පශ්චාත් යුද්ධ උත්පාතයේ ආර්ථික ප්‍රසාරනය, ධනේශ්වර ආර්ථිකයේ මූලික ප්‍රතිවිරෝධයන් ජයගනු ලැබුවේ නැත. ඊට පටහැනි ලෙස ආර්ථික උත්පාතය වඩාත් ඉහල මට්ටමක දී, ඒවා යලි මතුව ඒමට තුඩු දුන්නේය.

1950 හා 60 ගනන් වල ජාත්‍යන්තර වෙලඳමේ වර්ධනය මඟින්, බ්‍රෙට්න්වුඩ්ස් මූල්‍ය පද්ධතියේ ශක්‍යතාවට වල කැපීම ආරම්භ විය. මෙම ක්‍රමය යටතේ ලෝකයේ ප්‍රධාන මුදල් එකිනෙක සමඟ හා, එක්සත් ජනපද ඩොලරයට ස්ථාවර සම්බන්ධතාවක් සහිතව, හුවමාරු විය. එයට පිටුබලය සැපයුනේ අවුන්සයකට ඩොලර් 35 අනුපාතයකට අනුව රත්රන් වලිනි. වෙලඳම, ආයෝජන හා මිලිටරි වියදම් පුලුල් වෙද්දී කෙසේ වෙතත්, ජාත්‍යන්තර ආර්ථිකය සඳහා අවශ්‍ය ද්‍රවශීලතාවය සම්පාදනය කල එක්සත් ජනපදයෙන් පිටත සංසරනයේ පැවති ඩොලර් තොගය, ඊට පිටුබලය සැපයූ එක්සත් ජනපදය සතුව පැවති රත්රන් තොගය බොහෝ කොටම ඉක්මවා යාමට පටන් ගත්තේය.

බ්‍රෙට්න්වුඩ්ස් සම්මුතිය තවදුරටත් පවත්වාගෙන යමේ අර්ථය වූයේ, රත්රන් එක්සත් ජනපදයෙන් පිටතට ගලා යාමයි. එය වැලැක්විය හැකි එකම ක්‍රමය වූයේ මුලුමනින්ම ස්ථාවර ආර්ථික පසුබෑමක් හා අවධමනාත්මක ප්‍රතිපත්ති ක්‍රියාවට නැඟීමයි. එවක දී ඇමරිකානු කම්කරු පන්තියේ නැගිටීමකට ඉඩ සැලසීමෙන් තොරව එවැන්නක් කල නොහැකි විය.

ආයෝජන ප්‍රාග්ධනය පිටතට ගලා යාම වැලැක්වීමට හෝ මිලිටරි වියදම් කැපීමකට එක්සත් ජනපදයේ කැමැත්තක් ද නොතිබුනි. මින් මතුවට තව දුරටත් රත්රන් සඳහා ඩොලර් වලින් ගෙවීම් නොකරනු ඇතැයි නිවේදනය කිරීම සඳහා 1971 අගෝස්තු 15 දින රූපවාහිනියේ පෙනී සිටිමින් නික්සන්, පටලැවුනු ගැටය කපා හැරියේය. මෙම සිදුවීම, එක්සත් ජනපදය තුල ඇති තමන්ගේ ඉමහත් මූල්‍ය ආයෝජනයන්ගේ ආරක්ෂාව ගැන දැඩි අවධානයකින් පසුවන චීන මූල්‍ය අධිකාරීන්ගේ සිත් තුල අද දින හොල්මන් කරනවා නිසැකය. එක් සැඳෑවක තවත් එක්සත් ජනපද ජනාධිපතිවරයෙක් රූපවාහිනියේ පෙනී සිටිමින්, එම වත්කම් ආපසු ගත නොහැකි බව ඔවුන්ට පවසනු ඇත් ද?

ස්ථාවර මූල්‍ය සම්බන්ධතාවක් සඳහා වූ බ්‍රෙට්න්වුඩ්ස් පද්ධතියේ බිඳ වැටීම, දුර දිග යන ප්‍රති විපාක ගෙන ආවේය. සම්බන්ධතාවන්ගේ සංකීර්න ජාලයක් තුල සෑම ජාතික ආර්ථිකයක්ම, එන්ට එන්ටම ලෝක ආර්ථිකය මත රඳපවතින තත්ත්වයක් තුල ඉන් අදහස් කරන්නේ, ජාත්‍යන්තර ගනුදෙනුවල දී ස්ථාවර බවක් සැලසිය හැකි පරිදි නව මූල්‍ය යාන්ත්‍රනයක් වර්ධනය කල යුතුව ඇති බවයි.

මූල්‍ය ව්‍යුත්පන්නයන් ඉන් එක් යාන්ත්‍රනයක් විය. ඒවා මුලින් වර්ධනය කලේ ආනයන හා අපනයන කොන්ත්‍රාත් වල ලාභදායිකත්වය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇතිකල හැකි මූල්‍ය වෙලඳපොලවල උච්ඡාවචනයන්ට එරෙහිව, රක්ෂනයක් සැපයීම සඳහාය. මුදල් මිලට ගැනීමේ හා විකිනීමේ කොන්ත්‍රාත් ඇතිකර ගන්නා ලදී. එහෙත් මෙම කොන්ත්‍රාත්තු පවා ගනුදෙනු සඳහා යොදා ගත හැකි විය. එය තුඩු දුන්නේ නව මූල්‍ය වෙලඳපොලවල් නිර්මානය කිරීමටයි. තව ද, ජාතික මුදල හා ප්‍රාග්ධන නියාමනය බාදනය වීම හමුවේ, මුදල් එක් වෙලඳපොලකින් නයට ගෙන තවත් වෙලඳපොලක දී ප්‍රයෝජනයට ගත හැකි විය. මෙය, මූල්‍ය ගනුදෙනු පමනක් නොව පොලී අනුපාතික හැසිරවීම ද භාරගත් ව්‍යුත්පන්න කොන්ත්‍රාත් වල අවශ්‍යතාවය මතු කලේය. එසේම එවන් කොන්ත්‍රාත් මිලට ගැනීමට හා විකිනීමට ද හැකිවූ අතර මූල්‍ය වෙලඳපොලවල තවදුර ප්‍රසාරනයට මං පෑදීය.

බ්‍රෙට්න්වුඩ්ස් අභාවයට පත්වීමට අමතරව, ඊට නොඅඩු දුර දිග යන ප්‍රති විපාක ඇතිකල තවත් වෙනසක් ද ලෝක ආර්ථික තුල හිස එසවීය. එනම්, 1960 ගනන් මැද ප්‍රධාන ධනේශ්වර ආර්ථිකයන් සෑම එකක්ම හරහා දිව ගිය ලාභානුපාතිකයේ පහත වැටීමයි. මෙම වැටීම මඟින්, ලෝක ධනේශ්වර ආර්ථිකයේ ව්‍යුහයම තුල අති මූලික වෙනස්කම් වලට තුඩු දුන්, වෙලඳපොලවල් සඳහා තියුනු අරගලයක් දියත් කරනු ලැබින.

පන්ති අරගලයේ නැගීම ද තීරනාත්මක බලපෑමක් ඇති කලේය. 1968 මැයි-ජූනි මාසවල ප්‍රන්සයෙන් ආරම්භ වී පෘතුගාලය යලි ස්ථාවර වීමෙන් අවසන් වූ මෙම වකවානුව, සමහර විට විප්ලවවාදී තත්ත්වයන් කරා මාරු වීමේ විභවය ද සහිත කම්කරු පන්තියේ නැගිටීමකින් අංගලක්ෂිත විය. ධනේශ්වරය සෑදලය අරා පැවතුනේ වෘත්තීය සමිති නිලධරයන්ගේ ද ස්ටැලින්වාදී හා සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂවල ද පාවාදීමට පිංසිදු වන්නටය. කෙසේ වෙතත් පතුලේ තිබුනු ආර්ථික ගැටලු එසේ ම ඉතිරිව තිබුනේ වඩාත් ගැඹුරු වෙමින් ය. පශ්චාත් යුද්ධ උත්පාතය අවධියේ වැඩී ආ කාර්මික කම්කරු පන්තියේ සංකේන්ද්‍රනය මඟින් මේ ගැටලු ඔද්දල් කලේය.

1970 ගනන් අවසානයේ ධනේශ්වරය, කම්කරු පන්තියට එරෙහිව ප්‍රහාරයක් ඇරඹීය. එය රේගන් හා තැචර් ආන්ඩු බලයට පත්වීම තුලින් දේශපාලනිකව සලකුනු කල අතර "නිදහස් වෙලඳපොල" ධජය යටතේ දියත් විය. එයට ප්‍රධාන කොට ම එක්සත් ජනපදය හා බ්‍රිතාන්‍ය ඇතුලු බොහෝ දියුනු ධනේශ්වර රටවල කර්මාන්තයේ පුලුල් පදාසයන් විනාශ කිරීම ද ඇතුලත් විය. එම ක්‍රියාවලියම ඕස්ට්‍රේලියාව තුල 1983 සිට හෝක්ගේ ලේබර් ආන්ඩුව යටතේ ආරම්භ විය.

කර්මාන්තයේ පුලුල් ක්ෂේත්‍රයන් විනාශ කිරීම, ලාභ හා ප්‍රාග්ධන සමුච්ඡයකරනයේ මාධ්‍යයන් ලෙස මූල්‍යකරනය දෙසට හැරීම සමඟ අත්වැල් බැඳ ගත්තේය. මූල්‍යකරනය, අලුත් වටිනාකම් නිර්මානය කිරීමෙහි  ලා කම්කරුවන් සේවයෙහි යෙදවීම හා කර්මාන්ත සංවර්ධනය තුලින් ලාභ සමුච්ඡයකරනය වෙනුවට, වෙනත් තැනක නිෂ්පාදනය කල ලාභය උපුටාගැනීම සඳහා මූල්‍ය මාධ්‍යයන් වර්ධනය කිරීමේ ක්‍රියාවලියකට සම්බන්ධ විය.

කෙසේ වුවත්, 1980 ගනන් පුරාම සිදුවූ ප්‍රාග්ධන සමුච්ඡයේ මෙම නව මාදිලිය, තවමත් පැවතුනේ ආරම්භක අවස්ථාවේය. එය පිම් වලින් ඉහල නැගුනේ 1989 ජූනි මාසයේ දී චීනයේ ටියනාන්මෙන් චතුරශ්‍රයේ ජනඝාතනයෙන් පසුවය. සෝවියට් සංගමය විරේක කිරීමත් සමඟ 1992 දී චීන ස්ටැලින්වාදී නායකත්වය, විදේශ ආයෝජන සඳහා දොරටු විවර කිරීමටත්, ගෝලීය ප්‍රාග්ධන පරිපථයන් තුලට කෝටි සංඛ්‍යාත චීන කම්කරු පන්තිය ඒකාබද්ධ කිරීම සඳහා මඟ පෑදීමටත්, තීරනය කලේය. එම ඝාතනය වනාහි, ඇමරිකාවේ ද අනෙකුත් ප්‍රධාන ධනේශ්වර රටවල ද පාලක පන්තීන් වෙතට නිකුත් තල, මෙහි ඔබගේ ප්‍රාග්ධනය සුරක්ෂිතය, චීන පොලිස් රාජ්‍ය විසින් ආරක්ෂා කරනු ලබයි, යන පනිවිඩය විය. පනිවිඩය ලැබී වටහා ගන්නා ලදී. ජාත්‍යන්තර ධනේශ්වරයේ ප්‍රතිචාරය සංකේතවත් කලේ ඕස්ට්‍රේලියානු අගමැති බොබ් හෝක් විසිනි. සිසුන් වෙත එල්ල කල කුරිරු මර්දනය ගැන රූපවාහිනිය

ඉදිරියේ කඳුලු සැලූ ඔහු, විශ්‍රාම ගැනීමෙන් පසුව ඔහුගේ ධාරිතාවය අනුව උපදේශක සමාගමක ලොක්කෙකු ලෙස කටයුතු කරමින් ද චීනයේ ආයෝජන ගනුදෙනු සැලසුම් කරමින් ද දශ ලක්ෂ ගනන් මුදල් ඉපැයීය.

චීනය හා අනෙකුත් අඩු වියදම් සහිත රටවල් කරා හැරීම, අන්තර් සම්බන්ධිත අභිප්‍රේරනයන් දෙකක් මත සිදු විය. එය ලාභ තරකල අතර දියුනු ධනේශ්වර රටවල කම්කරු පන්තිය මත අඛන්ඩ පීඩනයක් යෙදීම සඳහා ද ප්‍රයෝජනවත් විය.

අඩු වියදම් රටවල් කරා නිෂ්පාදනය මාරු කිරීම, අතිරික්ත වටිනාකම නැංවීමෙහිලා කෙතරම් දායක වී ඇත්දැයි පරිපූර්නව නිවැරදි චිත්‍රයක් ලබා ගැනීම දුෂ්කරය. එහෙත් ගනන් බැලීම් අනුව ඊනියා විදේශයේ ස්ථානගත කිරීමෙහි ආරම්භක දායකත්වය මඟින්, නිෂ්පාදනයේ වියදම සියයට 40 කින් අඩුකිරීමට සමත් වී තිබේ. එහි අගය වසරකට ඩොලර් බිලියන සිය ගනනකි. මෙම ඉතිරිකිරීම්වලටත් වඩා වැදගත් වන්නේ මෙහි ප්‍රතිපල වශයෙන් ප්‍රාග්ධන සමුච්ඡකරන මාදිලියේ ම ඇතිව තිබෙන වෙනස්කම්ය.

නිදසුනක් ලෙස අයිපොඩ් ගැන සලකා බලන්න. ඩොලර් 200 කට අලෙවි කරන අයිපොඩ් එකක් චීනයේ නිෂ්පාදනය කිරීමට වැය වන්නේ ඩොලර් 4 ක් පමනක් බවට ගනන් බලා ඇත. කෙසේ වෙතත් නිෂ්පාදන සමාගම, නිෂ්පාදන ක්‍රියාවලියේ දී කම්කරුවන් වෙතින් උපුටා ගන්නා අතිරික්ත වටිනාකමින් හිමිකර ගන්නේ ඉතා සුලු කොටසක් පමනි. නිෂ්පාදන පිරිවැය හා විකුනුම් මිල අතර වෙනසින් කොටසක්, අයිපොඩ් නිෂ්පාදනයේ ශ්‍රමයට අඩංගු වන පරිගනක ක්‍රමලේඛකයන් (programmer) හා අනෙකුත් අයගේ පිරිවැයෙන් සමන්විත වෙයි. එහෙත් එක් එක් පුද්ගලික යෙදවුම් වල පිරිවැයේ කොන්දේසි අනුව මෙය ඉතා සුලු ප්‍රමානයකි. විශාල ගනනක් විය හැකි ක්‍රමලේඛකයන්ගේ හා අනෙක් අයගේ පිරිවැය, විශාල සංඛ්‍යාවක් වන ඒකක වෙත බෙදී යයි. ක්‍රමලේඛය ලියා අවසන් වූ විට කිසිදු අතිරේක වියදමකින් තොරව එය නිමක් නැතිව පිටපත් කල හැකිය. අයිපොඩ් එකක ක්‍රමලේඛන පිරිවැය ඩොලර් 6 ක් යයි සිතා ගනිමු. එතෙකුදු තවත් ඩොලර් 190 ක් ඉතිරිව තිබේ. මෙය, අයිපොඩ් අලෙවිකරන වෙලඳසැලේ හිමි කරුට ගෙවන බදු කුලිය, නය සම්පාදනය කල බැංකුවේ පොලිය, ප්‍රචාරක සමාගමට කරන ගෙවීම්, පිටපත් කිරීමේ අයිතිය වෙනුවෙන් කටයුතු කල නීතිඥ සමාගමේ ගාස්තු යනාදි වශයෙන් විවිධ දේපල හිමිකරුවන් අතර බෙදී යයි.

මෙහි දී සිදුව ඇත්තේ ගුනාත්මක වෙනසකි. තව දුරටත් අපට අතිරික්ත වටිනාකම සෘජු ලෙස උපුටා ගැනීමක් වෙනුවට දැකගත හැක්කේ, මූල්‍ය හා වෙනත් මාධ්‍යයන් මඟින්, වෙනත් තැනක නිර්මානය කරන අතිරික්ත වටිනාකම සූරාකෑමකි. එක්සත් ජනපදය හා එබැවින් ලෝක ආර්ථිකයේ ක්‍රියාකාරිත්වයට මෙම ක්‍රියාවලිය කෙතරම් වැදගත් කමක් දරන්නේ ද යන්න පිලිබඳ ප්‍රමානාත්මක දත්ත අප සතුව තිබේ. 1980 ගනන්වල දී සියලු ව්‍යාපාරික ලාභ වලින් මූල්‍ය ක්ෂේත්‍රයේ ලාභය සියයට 6 ක් පමන විය. 2006 වන විට මෙය සියයට 40 දක්වා ඉහල ගියේය.

මෙම ක්‍රියාවලිය දහනය කල එක් ප්‍රධාන සාධකයක් වූයේ ලාභ නය පහසුකම්ය. නය ඉතා ලාභ වූයේ, චීන මූල්‍ය අධිකාරීන් ඔවුන්ගේ ජපාන හා ඊනියා අතිරික්තයක් සහිත රටවල හවුල්කරුවන් සමඟ එක්ව, සිය ඩොලර් අරමුදල් එක්සත් ජනපද මූල්‍ය පද්ධතිය වෙත ප්‍රතිචක්‍රීය කිරීම නිසාය. මෙය එක්සත් ජනපදයේ නය ප්‍රසාරනය කිරීම සඳහා කොන්දේසි නිර්මානය කරමින් වෙලඳපොල ප්‍රසාරනය වීම සහතික කල අතර අනෙක් අතට, චීනයේ හා අනෙකුත් අඩු පිරිවැය සහිත රටවල නිෂ්පාදනය කල භාන්ඩ සඳහා වෙලඳපොලක් සැපයීය.

අවසාන විග්‍රයේ දී මූල්‍ය ප්‍රාග්ධනය උපුටාගත් ලාභ, ජාත්‍යන්තර කම්කරු පන්තියෙන් උපුටාගත් අතිරික්ත වටිනාකම් මත රඳා පැවතුනි. එහෙත් මූල්‍යකරන ක්‍රියාවලිය තමන්ගේ ම ජීවිතයක් ගොඩනඟා ගත්තේය. ලාභ නය ගලා එනතාක් දුරට හා එහි ප්‍රතිපල වශයෙන් වත්කම් අගය ඉහල නඟිනතාක් දුරට පෙනී ගියේ, ප්‍රාග්ධනයේ අතිශය තිරිසන් සිහින පවා සාක්ෂාත් කර ගත හැකි බවත්, එහි ආවේනික ස්වභාවය නිසා හුදෙක් මුදල් තව තවත් මුදල් උපයන බවත් ය.

මෙම ක්‍රියාවලිය දැන් ගොඩනඟාගෙන ඇත්තේ, වත්මන් හා අනාගත ආදායම් යන දෙකට ම හිමිකම් පාන මූල්‍ය වත්කම්, සැබවින්ම ඒවා රඳපවත්නා වූ කම්කරු පන්තිය වෙතින් උපුටා ගන්නා අතිරික්ත වටිනාකම වන සැබෑ ආදායම, බෙහෙවින් ඉක්මවා ගිය තත්වයකි. යලිත්, මූල්‍ය වත්කම් වල මෙම අධි සමුච්ඡය මැන බැලිය හැකි එකදු සංඛ්‍යා ලේඛනයක් හෝ සපයා ගැනීමට නොහැකිවී තිබේ. එහෙත්, 1980 ගනන් වල මූල්‍ය වත්කම් ප්‍රමානයෙන් ලෝක දල දේශීය නිෂ්පාදිතයට (දදේනි) දල වශයෙන් සමාන වූ බවත් වසර 25 කට පමන පසුව එය ලෝක දදේනි න් සියයට 300 සිට 400 දක්වා නැඟීමත් පිලිබඳ කාරනයෙන් එහි පරිමානය පිලිබඳව අදහසක් ලබා ගත හැකිය.

අධි සමුච්ඡය වීමකින් තොරව, දදේනි ට සමානුපාතිකව ලාභයේ පංගුව ඉහල නැඟීමට සලස්වන අතරම මූල්‍ය වත්කම් වලට, දදේනි ට වඩා වැඩි වේගයකින් වර්ධනය වීමේ හැකියාව තිබෙන බව සත්‍යයකි. 1980 ගනන් ආරම්භයේ පටන් දදේනි ට

ශ්‍රමයේ පංගුව පහතට තල්ලු කරන තත්ත්වය හමුවේ, ගෝලීය පරිමානව පැවති තත්ත්වය එයයි. මෙම වකවානු තුල ඇමරිකානු කම්කරුවන්ගේ මූර්ත වැටුප් වැඩිවී නැත. වෙනත් වචන වලින් කිවහොත් පසුගිය සියවස් කාලක් තිස්සේ පලදායිතාවය ඉහල යාමෙන් ධනයේ ඇතිවූ සියලු වර්ධනයන් ප්‍රාග්ධනයේ සූරා කෑම සඳහා යොදාගත හැකි විය. කෙසේ වෙතත්, දදේනි සමානුපාතිකව, මූල්‍ය වත්කම් තුන් ගුනයක් හා සිව් ගුනයක් අතර ප්‍රමානයකින් ඉහල නැගීමට වගකීවේ මෙය පමනක්ම නොවේ.

දැනට සිදුවෙමින් තිබෙන බිඳවැටීමේ ඓතිහාසික වැදගත්කම පිලිබඳ ප්‍රශ්නයට මෙහි දී අපි මුහුන දෙන්නෙමු. පසුගිය දශක තුන පුරා සැබෑ ධනයට සම්බන්ධිතව ප්‍රාග්ධනයේ අධි සමුච්ඡයකරනයේ අර්ථය, ප්‍රාග්ධනයේ ඉමහත් කොටසක් දැන් වනසා දැමිය යුතුව ඇති බවයි. පූර්වයෙන් පැවති ප්‍රාග්ධන සමුච්ඡයේ ව්‍යුහය බිඳ වැටී ඇති බවත් නව ව්‍යුහයක් ගොඩනැගිය යුතුව ඇති බවත් ය.

මෙම ක්‍රියාවලියේ තර්කනය පැහැදිලි කරමින් මාක්ස් සඳහන් කලේ, ප්‍රාග්ධනය සමස්තයක් ලෙසම අලාභයකට මුහුන දිය හැති බවයි. එහෙත් එය කිසි සේත් ම ප්‍රශ්නයේ අවසානය නොවේ. "මෙයට (අලාභයට) සම්බන්ධවී ඇති ප්‍රමානයට අනුව එක් එක් පුද්ගලික සාමාජිකයා කෙතරම් ප්‍රමානයක් දැරිය යුතු ද යන්න දැන් ශක්තිය හා කපටිකම පිලිබඳ ප්‍රශ්නයක් බවට" පත්වෙයි. ප්‍රාග්ධනයේ එක් එක් අංශය අලාභයේ තමන්ගේ පංගුව අවම කර ගැනීමටත් එය වෙනත් අයෙකු වෙත පැටවීටත් උත්සාහ දරයි.

මාක්ස්ට දැකගත හැකි වූයේ මෙම ක්‍රියාවලියේ ආරම්භය පමනි. මූල්‍ය ප්‍රාග්ධනය දැන් යෝධ ප්‍රමානයන්ගෙන් වර්ධනය වී ඇත. ආන්ඩුව, මාධ්‍ය, මහජන මතය මත එය අධිකාරය දරයි. එය සිය කටයුතු මත පැනවී ඇති සීමාවන්ගෙන් ගැලවීමට නීති පොත නැවත ලියයි. එය දැන් දේශපාලන බලයේ ලීවරයන් සිය පාලනය යටතට ගෙන ඇති අතර සිය පැවැත්ම සඳහා ඒවා, සමස්ත සමාජයේ ම ධනය කොල්ලකෑම සඳහා යොදා ගනියි. ලේමන් බ්‍රදර්ස් බැංකුව ගිලී ගිය අතර ඇමරිකන් ඉන්ටර්නැෂනල් ග්‍රෑප් මූල්‍යායතනය (ඒඅයිජී) ආන්ඩුවේ මුදලින් ඩොලර් බිලියන සිය ගනන් ලබාගනියි. වෙනස කුමක් ද? ඒඅයිජී ට ගෝල්ඩ්මන් සැක්ස් සමඟත් ගෝල්ඩ්මන් සැක්ස්ට එක්සත් ජනපද භාන්ඩාගාරය සමඟත් සමීප සබඳතා තිබීම නිසාය.

පසුගිය සතියේ දී බැංකු හා මූල්‍ය ප්‍රභූව විසින් සිය පාලනය ක්‍රියාත්මක කල තවත් නිදසුනක් අපට දැක ගත හැකි විය. මැයි 9 වන දින *වෝල් ස්ට්‍රීට් ජර්නල්* ප්‍රකාශනය පැහැදිලි කලේ ප්‍රධාන බැංකු වල තත්වය මැන බැලීම සඳහා එක්සත් ජනපද මහ බැංකුව හා භාන්ඩාගාරය විසින් සිදු කල ඊනියා "ආතති පරීක්ෂාවේ" ප්‍රතිපලය තීන්දු කිරීම සඳහා බැංකු විසින්ම බලපෑම් යොදා ඇති බවයි.

දෙසතියක් තිස්සේ සිදුවේගත ගිය දැඩි කේවල් කිරීමකින් පසුව සිය ආතති පරීක්ෂාව අවසන් කිරීමට මඳකට පෙර මහ බැංකුව, ජාතියේ ලොකුම බැංකු සමහරක් මුහුනපා සිටි ප්‍රාග්ධන බෝක්කු කට සැලකිය යුතු ප්‍රමානයකින් සිහින් කලේය.

ප්‍රාථමික වටයේ ප්‍රතිපල දැකීමෙන් පසුව, බැන්ක් ඔෆ් ඇමරිකා හා වෙල්ස් ෆාගෝ "දැඩි කෝපයට" පත්වූ අතර සංශෝධනයක් ඉල්ලා සිටියේය. මෙය කිසියම් වර්ගයක ශාස්ත්‍රාලික ගැටුමක් නොවූ අතර, බැංකුවල ලාභදායකත්වයට බලපාන හා නොවැදගත් නොවන, ඒවායේ විධායකයන්ගේ ප්‍රසාද දීමනා හා අනෙකුත් ගතමනාවන්ට සම්බන්ධ බිලියන ගනන් මුදල් ඒ පිටුපස පැවතියේය.

පහත හෙලන ලද එක් විශාලතම සංශෝධනයක් සිටි ග්‍රෑප් බැංකුවට හිමි විය. *වෝල් ස්ට්‍රීට් ජර්නලය* ට අනුව "සිටි ග්‍රෑප් හි ප්‍රාග්ධන හිගය මුලින් රැඳී තිබුනේ දල වශයෙන් බිලියන 35 ක මට්ටමේ ය. අවසානයේ එය බිලියන 5.5 ක් බවට පත් විය. සිදුවීමට නියමිතව තිබෙන ගනුදෙනු වල බලපෑම පිම්බීම සඳහා තමන් අත්කර ගන්නේයයි කියන අනාගත ප්‍රාග්ධනය ද ඇතුල් කිරීම සඳහා විධායකයන්, මහ බැංකුව ඒත්තු ගැන්වූහ."

අවසන් වැකිය ප්‍රවේශමෙන් සටහන් කර ගන්න. එය පෙන්නුම් කරන්නේ අප යලිත් එන්රොන් සමාගමේ ගිනුම් හුටපටය පැවති වකවානුවට පැමින සිටින බවකි. එහිදී මූල්‍ය ගිනුම් විධායකන් විසින් විකෘති කල අතර ප්‍රතිපලය සැබෑ තත්ත්වය නොව මුලුමනින්ම ව්‍යාජ පිලිබිඹුවකි. මෙම ප්‍රශ්නයේ දී දැන්, "නිර්මානාත්මක ගිනුම්කරනය" භාවිතා කරන්නේ එක් සමාගමක් සඳහා පමනක් නොව බැංකු හා මූල්‍ය පද්ධතිය පුරාවටම ය.

*ඇට්ලැන්ටික් මන්ත්ලි* අලුත්ම ප්‍රකාශනයේ පලවූ ජාමූඅ හිටපු ප්‍රධාන අර්ථශාස්ත්‍රඥයා වන සයිමන් ජොන්සන් ගේ "නිහඬ කුමන්ත්‍රනය" යන හිසින් යුත් ලිපියකින් පෙන්වා දෙන්නේ, මූල්‍ය ආසක්තයන් මඟින් දේශපාලන බලය ක්‍රියාත්මක ලෙස අත්අඩංගුවට ගෙන තිබෙන බවයි. මෙය *ෆිනැන්ෂල් ටයිම්ස්* හි මාටින් වුල්ෆ්ට, ඇමරිකාව නව රුසියාව ද? යන ප්‍රශ්නය මතු කිරීමට බල කලේය. වුල්ෆ් කියන්නේ එසේ නොවන බවයි. එහිදී (රුසියාවේ) දේශපාලන පද්ධතිය තුල අධිකාරය දරන්නේ අතිශයින්ම ධනවත් අර්ධ අපරාධකාරී කතිපයාධිකාරයකි. එහෙත් වුල්ෆ් ගේ පිලිතුර පෙන්නුම් කරන්නේ එක්සත් ජනපදයේ තත්ත්වය සැබවින්ම ඊටත් වඩා නරකය යන කාරනයයි.

"නැඟී එන ආර්ථිකයන් බොහාමයක දූෂනය ඉහවහා ගොස් තිබේ. එය විවෘතව ක්‍රියාත්මක වේ. එක්සත් ජනපදයේ දී එය වැඩි කොටම ගලා එන්නේ විශ්වාසයේ හා බලපෑමේ ක්‍රමයකිනි. වෝල් වීදියට හොඳ දේ ලෝකයට ම හොඳ යයි සැලකේ. ප්‍රතිපලය වූයේ එක්සත් ජනපදය සඳහා ද්වි පාක්ෂික නියාමනයක් සදොස් ලෙස සැලසුම් කිරීම හා එහි බලපෑම ලෝකයට පැවරීමයි."

වෙනත් වචන වලින් කිවහොත් රුසියාව තුල ධනවත් හා සාපරාධී මූලාශ්‍ර විවෘතව අධිකාරය දරන අතර ඇමරිකාවේ එය දේශපාලන පද්ධතියේ ව්‍යුහය තුලම ගොඩනැගී ඇති බවයි.

එහෙත් මෙය සිදුවූයේ කෙසේ ද? මූල්‍ය ප්‍රාග්ධනය නැඟගෙන නැඟගෙන යාමත් පරපුටුවාදය යෝධ පරිමානයකින් වර්ධනය වීමත්, නොඑසේ නම් නිරෝගී පද්ධතියක හුදෙක් "නරක" පැත්ත නොවේ. ඒ වනාහි, 1960 ගනන් අග හා 1970 ගනන් මුල මතුවූ ආර්ථික හා දේශපාලන ගැටලු විසඳීම සඳහා, ධනේශ්වරය විසින් යොදාගනු ලැබූ වර්ගයේම ක්‍රියාවලීන්ගේ ප්‍රතිපලයයි. එය පසුගිය දශක දෙක තිස්සේ ඇතිවූ ලෝක ආර්ථිකයේ ප්‍රසාරනයට පරිබාහිරව යම් ආකාරයකින් වැඩී ආවා නොව එයට ම මුඛ්‍ය වූවකි.

සමාජය ඉහල සිට පහලට ම ප්‍රතිසංවිධානය කිරීමේ කර්තව්‍යය මුන ගස්වමින් දැන් මෙම ආර්ථික ක්‍රියාවලීන්, ලෝක ධනවාදය බිඳවැටීමට තුඩුදී තිබේ. අප අවධාරනය කල පරිදි, මෙය සිදුවිය හැක්කේ ක්‍රම දෙකකින් එක් ආකාරයකටය. එක්කෝ ධනේශ්වරය විසින් ක්‍රියාත්මක කරන වැඩපිලිවෙලක් ඔස්සේය. නැතහොත් කම්කරු පන්තියේ මූලිකත්වය යටතේය.

ප්‍රතිව්‍යුහකරනයේ ධනේශ්වර වැඩ පිලිවෙලට, කම්කරු පන්තියේ සමාජ තත්ත්වය විනාශ කිරීමට නොඅඩු, නිෂ්පාදන බලවේගයන්ගේ විශාල කොටසක විනාශයත්, වෙලඳපොලවල්, ලාභ හා සම්පත් සඳහා එන්ට එන්ටම උත්සන්න වන ගෝලීය තරගය තුලින් හිස ඔසවන, වැඩෙන ගෝලීය ගැටුම හා යුද්ධයේ තර්ජනය අන්තර්ගත කර ගනියි.

මෙම යුගයේ කම්කරු පන්තියේ ප්‍රවිෂ්ටය කුමක් විය යුතු ද? ප්‍රථම කොටම අවශ්‍යවන්නේ තමන්ගේ ම ඓතිහාසික අත්දැකීම්, විශේෂයෙන්ම පසුගිය දශක හතරේ, සමාලෝචනය කිරීමයි.

1968-75 කාලය තුල විප්ලවවාදී විභවයන් ගැබ්කරගත් කම්කරු පන්තියේ ඉමහත් ජාත්‍යන්තර නැගිටීම් දැකගත හැකි විය. එහෙත් ගැටලුව වූයේ විභවය සහිතව ම ඒවා එතැන්හි සිරවී තිබීමයි. එම ව්‍යාපාරය සැබෑ වශයෙන් දේශපාලන බලය අල්ලා ගැනීමකින් කෙලවර නොවීය. ඒ, කම්කරු පන්ති නායකත්වයේ පාවාදීම් වලට පින්සිදු වන්නටය. ධනේශ්වරය සැදලය අරා සිටි අතර සිය අවශ්‍යතා රැකගැනීම සඳහා දේශපාලන තත්ත්වය යහපත් අතට හැරීමත් සමඟ, ආර්ථිකයේ හා පන්ති සම්බන්ධතාවන්ගේ දැවැන්ත ප්‍රතිසංවිධානයකට මුල පිරීය.

කම්කරු පන්තිය 1980 ගනන් පුරාම මෙම වැඩ පිලිවෙලට ප්‍රතිරෝධය පාමින් අරගල මාලාවක් දියත් කලහ. එහෙත් ආර්ථික ගෝලීයකරනයේ අර්ථය වූයේ, කම්කරු පන්තිය ගැටගසා තිබුනු ජාතික ප්‍රතිසංස්කරනයේ ඉදිරිදර්ශනය, එහි සියලු ශක්‍යතා අහිමිකරගත් බවයි. අවසාන විග්‍රයේදී මෙම අරගල පරාජය වීමේ හේතුව එයයි. තව ද, කම්කරු පන්තිය සිය අවශ්‍යතා සරිකර ගැනීමේ මාධ්‍යය ලෙස බලාපෙරොත්තු තබා සිටි ජාතිකව පදනම්වූ වෘත්තීය සමිති, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී හා ලේබර් පක්ෂ දැන් ධනේශ්වර ක්‍රියාමාර්ගයේ ප්‍රධාන බලගන්වන්නා බවට පත්විය.

සිය පැරනි සංවිධාන ධනේශ්වර පාලනයේ ම ව්‍යුහය තුලට මුලුමනින්ම ඒකාග්‍රවීම හා ජාතික ප්‍රතිසංස්කරනයේ පැරනි වැඩ පිලිවෙල බිඳ වැටීම හමුවේ කම්කරු පන්තියේ විශාල කොටස්, සිය සමාජ හා ආර්ථික අවශ්‍යතා රැකගැනීමට උත්සාහ කලේ, පුද්ගලික ආරම්භකත්වයන් හෝ "මුදුන් පේලිය" ලෙස හඳුන්වාදුන් යාන්ත්‍රනයක එනම්, වැඩිපුර අතිකාල හා දිගු පැය ගනන් වැඩ කිරීම, එකකට වඩා රැකියාවන් කිරීම, පවුල් සාමාජිකයන් වැඩි ගනනක් රැකියාවන්ට යොමු කිරීම හා සියල්ලටත් වඩා, වැඩි වැඩියෙන් නය ගැනීම යන මාධ්‍යයන් තුලිනි. කෙසේ වෙතත්, අනෙකුත් කොටස්වලට මෙම ක්‍රමෝපායන් පවා සලසාගත නොහැකි විය. ඔවුන් දැනට පරම්පරා දෙකක් පුරා දිව යන දුගීභාවයේ පහතට නැඹුරු වූ සර්පිලයකට ඇද වැටී සිටියි.

ධනේශ්වර ආර්ථිකයේ බිඳවැටීමෙහි අර්ථය, පසුගිය දශක දෙකෙහි පැවති "මුදුන් පේලියේ" යාන්ත්‍රනය බිඳී විසිරී ගොස් ඇති බවයි. ධනේශ්වරය, බොහෝ දෙනෙක් දැනටමක් අත්විඳිමින් සිටින වර්ගයේ දරිද්‍රතාවයකට කම්කරුවන් හා ඔවුන්ගේ පවුල් ඇද දැමීමට අදිටන් කරගෙන සිටියි. කම්කරු පන්තිය සමාජ හා දේශපාලන අරගලයකට යලි පිවිසිය යුතුය. කම්කරු පන්තිය එසේ කල යුත්තේ ධනේශ්වර පද්ධතියේ බිඳවැටීමෙන් මතුකර තිබෙන කර්තව්‍යයන් වටහා ගැනීමේ පදනම මත නව දේශපාලන ඉදිරිදර්ශනයකින් සන්නද්ධවය. එනම්, කම්කරු පන්තිය ලෝක ආර්ථික හා සමාජ පර්යාය යලි ගොඩනැඟීම සඳහා ස්වකීයමය වූ ස්වාධීන මූලිකත්වයක් වර්ධනය කල යුතුය. ඊට අඩු කිසිවක් නොවේ.

ධනවදයේ බිඳවැටීමෙහි අර්ථය මෙයයි. මානව වර්ගයාගේ නිෂ්පාදන බලවේග, පුද්ගලික අයිතිය හා ජාතික රාජ්‍ය පද්ධතිය මත පදනම්වූ පැරනි සමාජ සම්බන්ධතා කට්ටලය තුල, තව දුරටත් වර්ධනය කල නොහැකි බව මෙයින් සනිටුහන් කෙරෙයි. සමාජ ආර්ථික සම්බන්ධතා, ධනේශ්වර සමුච්ඡයකරනයේ අන්ධ නියාමයන්ට තව දුරටත් යටත්කර තැබුව හොත් සමාජය, ව්‍යසනයකට මුහුනපානු ඇත. විචාරවත් පදනමක් මත සමාජ සම්බන්ධතා ප්‍රතිසංවිධානය කිරීමට ඉඩ සැලසෙන පරිදි, ලාභ පද්ධතිය හා සමාජ ධනය අල්පතරයකගේ අවශ්‍යතාවන්ට සාපරාධී ලෙස යටත්කර තැබීම අවසන් කල යුතුය. කෙටියෙන් කිවහොත් මානව වර්ගයාට පෙරට යෑමට නම්, සමාජයේ සමාජවාදී පරිවර්තනය ඓතිහාසික අවශ්‍යතාවක් බවට පත්ව තිබේ.

කෙසේ වෙතත් මාර්තු 4 දින නේෂන් පත්‍රයට ලියමින් බාබරා ඒරිනරීච් අපට දන්වා සිටින්නේ, මූල්‍ය ප්‍රාග්ධනය මගින් නිර්මිත දැවැන්ත වෙනස්කම් සමාජවාදය සිදුවිය නොහැක්කක් බවට පත්කර තිබෙන බවයි. "කාර්මික ධනවාදයේ ද්‍රව්‍යමය යටිතල ව්‍යුහය, එනම් 'නිෂ්පාදන මාධ්‍යය,' ජනතාව විසින් පවරාගෙන හෝ අල්ලාගෙන, පොදු යහපත වෙනුවෙන් යොදාගැනීමට පටන් ගැනීම කජු කන්නා වැනි දෙයක් යයි සමහරු කල්පනා කරති. එහෙත් නිෂ්පාදන මාධ්‍යය බොහොමයක් විදේශයන්ට පලාගොසිනි. නිදසුනක් ලෙස ඒකාධිපති ධනවාදයේ අට්ටාලය වන චීනයට. අප අප වටා ඇති වඩ වඩාත් වැසුනු භූ දර්ශනය දෙස බලන්නේ නම් හා මූල්‍ය ධනවාදයේ නටඹුන් සෝදිසි කරන්නේ නම්, අපට දැක ගත හැක්කේ, එකක් පිට එකක් බැංකු, දේපල හා උකස් සමාගම්, හිමිකාර සමාගම්, රක්ෂන සමාගම්, නය වර්ගිකරන ආයතන හා ඇමතුම් මධ්‍යස්ථාන මිස, අපට සැබවින්ම ප්‍රයෝජනයට ගත හැකි ආහාර හෝ බෙත්හේත් වැනි කිසිවක් සාදන සෑහෙන තරම් ව්‍යවසායන් නම් නොවේ."

තවත් රටක දී ඒරින්රීච්ට දේශපාලනිකව සමාන හැඩ රුව ඇති, මුලාවෙන් ගොඩ ආ බව සිතන රැඩිකලුන් හා හිටපු රැඩිකලුන්, ඔවුන්ගේ සුවිශේෂී ජාතික තත්ත්වයන්ට ගැලපෙන මෙම තානයට, ඔවුන්ගේ ම ප්‍රභේදයන් එක්කාසු කරනු ලැබේ. මෙහි සමාජවාදයට ඉඩක් නැතැයි ඔවුහු කියා සිටිති. මක්නිසා ද යත්, නිෂ්පාදන කර්මාන්තය අප සතු වුව ද, වටිනාකම් දම්වැලෙහි සියල්ල අප සතුව නැති බැවිනි. ඇත්තේ කොටසක් පමනි. ඒවායේ මූලාරම්භය ඇත්තේ රටින් පිටත වෙනත් තැනකය. එබැවින් මෙහි සමාජවාදය ගොඩනැගිය නොහැකිය.

මේ සියල්ලෙහි අර්ථය කුමක් ද? සමාජවාදයට ඉඩක් නැති කම නොව සමාජවාදී සමාජයක් ජාතික පදනමක ගොඩනැගිය නොහැකි වීමයි. එහෙත් සියලු වර්ගයේ ජාතික ප්‍රතිසංස්කරනවාදයෙන් අව්‍යාජ සමාජවාදය වෙනස්වී තිබෙන තැන හරියට ම එතැනයි. සෝවියට් සංගමය තුල ට්‍රොට්ස්කි හා වාම විරුද්ධ පක්ෂයත්, නැගී එමින් තිබුනු ස්ටැලින්වාදී නිලධරයත් අතර අරගලයේ හදවතෙහි ම පැවතියේ මෙම ප්‍රශ්නයයි. ගැටුම හටගත්තේ තනිරටක සමාජවාදය හා ලෝක සමාජවාදී විප්ලවය සඳහා පැවති අවශ්‍යතාවය අතරයි.

එරින්රීච් සමාජවාදයට අවස්ථාවක් නැතැයි කියා සිටින්නේ ධනවාදය විසින් ජාත්‍යන්තර ශ්‍රම විභජනයක් හඳුන්වා දී තිබීම නිසාය. එහෙත් කාරනය මෙහි සම්පූර්න අනෙක් පැත්තය. ජාත්‍යන්තර ශ්‍රම විභජනය හා ඉන් පසුව ලෝකය පුරා කම්කරු පන්තියේ ශ්‍රමයෙහි ඒකාග්‍රකරනය හරියට ම, ධනවාදය විසින් නිර්මානය කරන ලද ජාතික රාජ්‍ය පද්ධතිය මානව වර්ගයාගේ ඉදිරි වර්ධනයට බාධකයක් ලෙස පිහිටුවමින්, සමාජවාදය ඓතිහාසික අවශ්‍යතාවක් බවට පත්කර තිබේ.

ජාත්‍යන්තර කම්කරු පන්තිය විසින් දේශපාලන බලය අල්ලා ගැනීම, එකවිට සිදුවන තනි ක්‍රියාවක් ලෙස හට නොගන්නේය යන්න සත්‍යයකි. දේශපාලන සුපිරි ව්‍යුහය තුල සිදුවන වර්ධනයන්ට, ඉන් වඩාත්ම ප්‍රගාඪ වන්නේ සමාජවාදී විප්ලවයයි, ඒවායේ ම නීති තිබේ. එහෙත් අවසාන විග්‍රහයේ දී ඒවා තීරනය කරන්නේ සමාජයේ ආර්ථික පදනමෙහි වෙනස්කම් මගින් ය. ගෝලීය මූල්‍ය ප්‍රාග්ධනය විසින්, ගෝලීය නිෂ්පාදන ඒකාග්‍රකරනය හා ජාත්‍යන්තර කම්කරු පන්තිය මත අධිකාරය දැරීමේ අර්ථය, කම්කරු පන්තියේ දේශපාලන අරගල වර්ධනය වනු ඇත්තේ වඩ වඩාත් ජාත්‍යන්තර පරිමානයකින්ය යන්නයි. මෙය ලෝක පක්ෂයක් ගොඩනැගීමේ අවශ්‍යතාවය මතු කරයි.

සමාජවාදී විප්ලවය ඇරඹුනු කල එය වේගයෙන් පැතිර යන බව සහතික වශයෙන්ම අපට කිව හැක. තීරනාත්මක භූමිකාව ඇමරිකානු කම්කරු පන්තිය විසින් ඉටු කරනු ඇත.

ඇමරිකානු මාධ්‍යවේදියෙකු හා විප්ලවවාදියෙකු වූ ජෝන් රීඩ් රුසියානු විප්ලවය පිලිබඳව තක්සේරු කල සිය කෘතිය නම් කලේ ලොව සෙලවූ දස දවස ලෙසය. ලෝක සමාජවාදය සඳහා අරගලයේ කොටසක් ලෙස දේශපාලන බලය අල්ලා ගැනීම පැහැදිලිව ම සිය කර්තව්‍ය හා අරමුන බව සනිටුහන් කර ගන්නා එක්සත් ජනපද කම්කරු පන්තියේ සමාජවාදී ව්‍යාපාරයක මතුවීම, සැබවින්ම වේගවත් බලපෑමක් ජනනය කරනු ඇත. එය ලෝකය සොලවනු පමනක් නොව පරිවර්තනය කරනු ද ඇත.

**© www.wsws.org**